# පුංචි ටිකිරි



නෙත්මි ආකර්ෂා දිසානායක

# පුංචි ටිකිරි

නෙත්මි ආකර්ෂා දිසානායක

# පුංචි ටිකිරි

© නෙත්මි ආකර්ෂා දිසානායක
කර්තෘ ප්‍රකාශයකි.

| | |
|---|---|
| ප්‍රථම මුද්‍රණය | : 2025 පෙබරවාරි 08 |
| කර්තෘ | : නෙත්මි ආකර්ෂා දිසානායක |
| පාසල | : මහමායා බාලිකා විදුහල |
| ශ්‍රේණිය | : 5 ශ්‍රේණිය |

**ISBN 978-624-208-685-9**

# පිදුම

නිතර යහමඟ පෙන්වමින්

හොඳ නරක කියාදෙමින්

නිතර දෙලොවෙහි මා රකිමින්

මගේ දිවිමඟ එළිය කිරීමට වෙරදරන

මගේ ආදරණීය පියාණන්ට හා මෑණියන්ට

පුදමි මේ පොත් පිංච

හද පිරි සතුටින්

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක කාලෙක අත්තම්මා කෙනෙක් හිටියා. මේ අත්තම්මා හරි ම කරුණාවන්තයි. එයා ළමයින්ට ගොඩක් ආදරෙයි. ලස්සන ලස්සන කතන්දර කියා දෙනවා. අත්තම්මාගේ ගෙදර කතන්දර අහන්න ළමයින් ගොඩක් රැස් වෙයි. අත්තම්මා කතන්දර කියාදෙන අතර හැම ළමයෙකුටම කහට කෝප්පයක් නම් දෙන්න වරද්දන්නේ නැහැ. අත්තම්මා මෙයින් විශේෂ කැමැත්තක් දක්වන ළමයෙක් සිටිය ඇය ටිකිරි.



මේ අත්තම්මා ටිකිරිට ගොඩක් ආදරෙයි. ටිකිරිත් මේ අත්තම්මාට ගොඩක් ආදරෙයි. ටිකිරි අම්මා තාත්තා නැති අසරණ ළමයෙක් ටිකිරි කුඩා පැල්පතක තමයි ජීවත් වෙන්නේ. ඇය පලතුරු විකුණලා ජීවත් වුණා. ඇගේ අසරණකම දුටු අත්තම්මාට දුක සිතුනි. කාත් කවුරුවත් නැති ටිකිරි බොහෝ දුක සේ කාලය ගත කළා. ඇයගේ පාළුව, තනිකම මකා ගැනීමට සිටියේ අත්තම්මා පමණි. ඇය අත්තමාගේ සෑම වැඩකට ම උදව් කරමින් අත්තම්මාගේ සිත දිනා ගත්තාය.



ටිකිරිගේ මේ දුෂ්කර ජීවිතය දුටු අත්තම්මා ටිකිරිව තම ගෙදර තබා ගැනීමට තීරණය කළා. පාළුවෙන්, තනිකමින් මිරිකී සිටි ටිකිරි ද අත්තම්මා ළඟට යෑමට තීරණය කළා. ටිකිරිගේ දෙමාපියන්ගෙන් ලැබූ ආදරය අහිමි වීමෙන් පසු අත්තම්මාගේ ආදරය කරුණාව මැද ඇය අලුත් ජීවිතයකට පණ දුන්නාය. ටිකිරිගේ දෙමාපියන් නැති අඩුව අත්තම්මා ටිකිරිට දැනෙන්න දුන්නේ නැහැ. අත්තම්මාගේ ආදරය මැද ටිකිරි ජීවත් වන්නේ කුඩා දරුවෙක් මෙනි.




ඇගේ දෙමාපියන් මිය යාමත් සමඟම ටිකිරිගේ අධ්‍යාපනය අඩාල විය. ටිකිරි ඉගෙනීමේ කටයුතුවලට හරිම දක්ෂයි. ඇය කම්මැලි නොවී පාසල් යෑමට කැමැත්තක් දක්වයි. ඒ නිසාවෙන් අත්තම්මා ගමේ පාසලට ඇයව ඇතුළත් කිරීමට තීරණය කළා. ටිකිරි දැන් උදේ පාන්දරම අවදි වී අත්තම්මාගේ උයන පිහින වැඩ වලට උදව් කරමින් පාසල් යාමට සැරසෙයි.



ටිකිරි අද පාසල් ගොස් පැමිණියේ ඉමහත් සතුටින්ය. තම පාසල ගැන ටිකිරි අත්තම්මා සමඟ පවසන්නේ හරිම ආඩම්බරයෙනි. අත්තම්මාත් එය අසා සිටින්නේ උතුරා යන සතුටකි. ටිකිරි උදෑසනම අවදි වී පාසලට යයි. ඇයට පන්තියේ යහළුවන් ද බොහෝ පිරිසක් සිටියි. එම යහළුවන් අතර ද ඇය ආදරය, කරුණාව දිනාගෙන සිටියා ය. ඇය ඉගෙනීමට ඉතාමත් දක්ෂ වූවාය. ඇය ගුරු දෙමාපියන්ගේ ද සිත් දිනාගත්තා ය.



ටිකිරි පාසලේ පමණක් නොව ගමේ ද ලොකු කුඩා කා අතරත් සිත් දිනා ගත්තාය. අත්තම්මාට ඇය ගැන පුදුම සතුටක් දැනුනාය. ටිකිරි ගමේ දහම් පාසලට ද ඇතුළත් කළාය. ඇය ඉරිදාට ද දහම් පාසල් යන්නේ ඉමහත් භක්තියකිනි ඇය දහම් පාසලේ ද කා අතරත් කතා බහට ලක්විය. ඇය ගමේ පන්සලේ හාමුදුරුවන්ගෙන් ද ගරු බුහුමන් ලබයි. ඇය "පුංචි ටිකිරි" නමින් කා අතරත් ප්‍රසිද්ධ විය.



ඇය ඉගෙනීමට කොච්චර දක්ෂ ද කීවොත් ඇය පන්තියේ පළමු වෙනියාය. ඇය පාසලේ ක්‍රීඩා අංශයෙන් ද ඉදිරියට යමින් සෑම පැත්තෙන්ම දක්ෂතා පාමින් ඇය තවත් ප්‍රසිද්ධියට පත් වූවාය. ඇය අධ්‍යාපන කටයුතු ද කරගෙන යන ගමන් අත්තම්මාගේ එළවළු කොටුවේ වැඩට ද උදව් කිරීමට අමතක නොකළාය.



ඇය දැන් පාසලේ වැඩට මෙන්ම ගෙදර දොරේ වැඩවලටද දක්ෂ දැරියකි. ඇය දැන් උසස් පෙළ ද ලියන කාලය එළඹුණි. ඇය එයින් ද විශිෂ්ට ජයක් ලැබුවාය. අත්තම්මාට දරා ගන්න බැරි සතුටක් දැනුනා. එම නිසා ම ඇය වැළඳ ගත්තා ය. අත්තම්මා ටිකිරිට පැවසුවේ ඉතිරි ටිකත් මම දරුවෝ කොහොම හරි වියදම් දරන්නම්. විශ්ව විද්‍යාලයට ගිහින් හොඳට ඉගෙනගෙන හොඳ රැකියාවක් කරන්න. ඇත්තටම ටිකිරි විශ්ව විද්‍යාලයේ ද කැපී පෙනෙන ශිෂ්‍යාවක් වුණා ය.



කාලය ගත වුණි. ඇය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ කාලය අවසන් විය. ටිකිරි වෛද්‍ය විද්‍යාලයේ ද කැපී පෙනෙන ලෙස උපාධිය අවසන් කළාය. ටිකිරි වෛද්‍යවරියක් වීමේ අදහසින් තම අත්තම්මා සමඟ සතුටින් කතාබහේ යෙදෙන අතර පියුම් මාමාගෙන් ලියුමක් ආවේ ය. එය බැලූ ටිකිරි මහ හයියෙන් කෑගසමින් උඩ පැන්නා ය. අත්තම්මේ අත්තම්මේ මට වෛද්‍යවරියක් වශයෙන් සේවය කරන්න ඇවිත්. අත්තම්මාත් ටිකිරිත් තම සතුට විඳගත්තා.



ටිකිරිට දැන් කිසිම ප්‍රශ්නයක් නැහැ. ඇයදැන් අනුරාධපුර රෝහලේ වෛද්‍ය වරියක් වශයෙන් සේවයේ යෙදෙනවා. ඇය ලොකු කුඩා කාගේත් හිත් දිනාගනිමින් සේවය කරයි. උදේ පාන්දරින්ම වැඩට යන්න සාරිය ඇදගෙන යන විට අත්තම්මාට පුදුම ආඩම්බරයක් දැනෙන්නේ ටිකිරි දැන් අත්තම්මාටත් එළවළු කොරටුවේ වැඩ කරන්න දෙන්නේ නැහැ. ඇය තම අත්තම්මාටත් සැපවත් ජීවිතයක් ලබාදෙමින් ඉතාමත් සතුටින් ජීවත් විය.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**ISBN 978-624-208-685-9**